ඉන්දියානු මහ **කොමසාරිස්** කාර්යාලය
**කොළඹ**

# පුවත්පත් නිවේදනය

## සංස්කෘතික සබඳතා සඳහා ඉන්දියානු කවුන්සිලයේ (ICCR) 75 වන ස්ථාපිත දිනය අග්‍රාමාත්‍ය **ආචාර්ය** හරිනි අමරසූරිය මැතිනියගේ ප්‍රධානත්වයෙන් කොළඹ දී පැවැත්වේ

ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය සහ ICCR ආදි ශිෂ්‍යාවක වන ආචාර්ය හරිනි අමරසූරිය මැතිනිය 75 වන ICCR ස්ථාපිත දිනය සමරමින් කොළඹ දී පැවති උත්සවය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස සහභාගී විය. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය විසින් 75 වන ICCR ස්ථාපිත දිනය 2025 මැයි 30 වන දින කොළඹ දී සමරන ලදී. දෙරට අතර මනා සංස්කෘතික සුසංයෝගය පිළිඹිබු කරමින් ඉන්දිය සහ ශ්‍රී ලාංකිය නර්තනාංගයන්ගෙන් සහ ගීතයන්ගෙන් උත්සවය අලංකාරවත් විය.

2. ඉන්දියාව සහ ලෝකය අතර අවබෝධය, සුහදත්වය සහ සහයෝගීතාවය ප්‍රවර්ධනය කරමින් ඉන්දියාවේ සංස්කෘතික රාජ්‍ය තාන්ත්‍රිකභාවයේ පෙරමුණේ සිටින ආයතනයක් වන සංස්කෘතික සබඳතා සඳහා ඉන්දියානු කවුන්සිලය ස්ථාපනය කරන ලද දිනය වන බැවින් මෙම දිනය ඉමහත් වැදගත්කමක් උසුලයි. මෙම දිනය ICCR ප්‍රයත්නයන් හි පදනම වන විවිධත්වය, අන්තර්ග්‍රහණීයත්වය සහ අන්‍යෝන්‍ය ගෞරවය යන වටිනාකම් සංකේතවත් කරන්නේ එය සංස්කෘතික හුවමාරුවේ සහ සුසංයෝගයේ පිළිඹිබුවක් බවට පත් කරමිනි.

3. මෙම උත්සවය සමාරම්භ කරමින් නියෝජ්‍ය මහ කොමසාරිස් වෛද්‍ය සත්‍යාංජලි පාණ්ඩේ මහතා 75 වන ICCR ස්ථාපිත දිනය නිමිත්තෙන් ශ්‍රී ලංකාවේ පිහිටි ICCR මධ්‍යස්ථානය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ සාමාජික සාමාජිකාවන්ට සිය සුභාශිංසන පළ කළේය. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය යටතේ පවතින ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය ද මේ වන විට වසර 25ක් සම්පූර්ණ කර තිබේ. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර අචල මිතුදමේ සාක්ෂියක් ලෙස ස්ථාපනය කරන ලද මෙය සංස්කෘතික හුවමාරුව, අගය කිරීම සහ සංවාදය සඳහා මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කරයි.

4. මෙම අවස්ථාව අමතමින් අග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය මැතිනිය ICCR වෙත සුභාශිංසන පළ කළ අතර ICCR ශිෂ්‍යත්වයක් යටතේ ඇය දිල්ලි විශ්ව විද්‍යාලයේ ගත කළ සුන්දර කාලය ද සිහිපත් කළාය. එම අත්දැකීම් ඇයගේ අධ්‍යයන සහ පෞද්ගලික ජීවිතය හැඩ ගස්වා ගැනීමට බෙහෙවින් ඉවහල් වූ බව ඇය සඳහන් කළාය. ලොව දෙවන විශාලතම අධ්‍යාපන මධ්‍යස්ථානය වන ඉන්දියාව තුළ පුළුල් පරාසයක පැතිරුණු විවිධ

පාඨමාලා පිරිනමන විශ්ව විද්‍යාල දහසකට අධික සංඛ්‍යාවක් තිබේ. ICCR විසින් සෑම වසරකම ඉන්දියාවේ ප්‍රමුඛ පෙළේ විශ්ව විද්‍යාල 120කට අධික සංඛ්‍යාවක විවිධ විෂයන් යටතේ උපාධි, පශ්චාත් උපාධි සහ ආචාර්ය උපාධි හැදෑරීම සඳහා ශ්‍රී ලාංකිකයන් සඳහා පූර්ණ ශිෂ්‍යත්ව 200කට අධික සංඛ්‍යාවක් පිරිනමනු ලබයි.

5. ඉන්දියාවට පත් කර තිබෙන ශ්‍රී ලංකා මහ කොමසාරිස් මහිෂිණි කොළොන්නේ, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ උප කුලපති මහාචාර්ය පී. එම්. සී. තිලකරත්න, බෞද්ධ සහ පාලි විශ්ව විද්‍යාලයේ උප කුලපති මහාචාර්ය පූජ්‍ය හෝමාගම ධම්මානන්ද හිමි, වවුනියා විශ්ව විද්‍යාලයේ ප්‍රථම උප කුලපති මහාචාර්ය ටී. මංගලේශ්වරන් යන පූජ්‍ය පක්ෂය සහ මහත්ම මහත්මීන් ඇතුළු ICCR ආදි සිසු සිසුවියන් සහ අධ්‍යයන ක්ෂේත්‍රයේ ප්‍රමුඛයන් රැසක් මෙම උත්සවය ඇමතූහ.

6. ආචාර්ය රවිබන්ධු විද්‍යාපති, චන්දන වික්‍රමසිංහ, ගීත් ප්‍රේමචන්ද්‍ර, වෙරෝනිකා දිසානායක, අජිත් අතපත්තු, ලහිරු කෝමන්ගොඩ සහ පේෂල මනෝජ් ඇතුළු ඉන්දියාවේ ඉගෙනුම ලැබූ ප්‍රවීණ කලාකරුවන් විසින් ඉදිරිපත් කළ සංස්කෘතිගාංගයන්ගෙන් උත්සවය විචිත්‍රවත් විය. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර අවබෝධය ඉහළ නංවමින් සහ දෙරට අතර බැඳීම තවත් සවිමත් කරමින් සංස්කෘතික තානාපතිවරුන් බිහි කිරීමෙහි ලා ICCR සහ ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය විසින් සිදු කරන අනුපමේය කාර්යභාරය මෙම උත්සවය තුළින් මැනවින් ප්‍රදර්ශනය විය.

7. ඉන්දියාව සහ ලෝකය අතර සංස්කෘතික සබඳතා සහ අන්‍යෝන්‍ය අවබෝධය ශක්තිමත් කිරීම සහ වෙනත් රටවල් සහ එම රටවල ජනතාව සමඟ සංස්කෘතික හුවමාරු ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 1950 වසරේ දී ඉන්දියාවේ ප්‍රථම අධ්‍යාපන අමාත්‍ය මවුලානා අබුල් කලාම් අසාද් මහතා විසින් ICCR පිහිටුවන ලදී. පසුගිය වසර 75 පුරාවට ICCR ඉන්දියාවේ පොහොසත් සංස්කෘතිය ගෝලීය වේදිකාව තුළ ප්‍රවර්ධනය කිරීමෙහි ලා මාහැඟි මෙහෙවරක් ඉටු කර ඇත. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය යටතේ පවතින ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ පිහිටි ICCR මධ්‍යස්ථානය වේ.

***

**කොළඹ**
***2025* මැයි *30***